www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පොලිස් මිනීමැරුම් වැලක්

## A spate of police killings in Sri Lanka

**සමන් ගුනදාස විසිනි**
**2005 අප්‍රේල් 28**

නීතිය හා සාමය සුරකීමේ උද්ඝෝෂන ව්‍යාපාරය මධ්‍යයේ සැක කටයුතු පොලිස් මිනීමැරුම් වැලක් පසුගිය කාලසීමාවේ දී ශ්‍රී ලංකාවෙන් වාර්තා විය. පසුගිය මාස හතර තුල දී පමනක්, අඩුම තරමින් මරන 19ක් මාධ්‍ය තුලින් වාර්තා විය. එම සෑම අවස්ථාවකදී ම, අත් අඩංගුවෙන් මිදී පලායෑමට තැත් කල සැකකරුගේ ප්‍රහාරයෙන් මිදීමට ඔවුනට ආරක්ෂාකාරී පියවරවල් අනුගමනය කිරීමට සිදු වූ බව පොලීසිය පැහැදිලි කලේ ය. නිහඬ බව රැකීමෙන්, පාලක එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය එම පොලිස් ක්‍රියාකාරකම් අනුමත කර ඇත.

වැඩි වැඩියෙන් පොලිස් මැදිහත්වීම සහ තදබල පියවරවල අවශ්‍යතාව සමාන්‍යයෙන් අවධාරනය කරන ඩේලි මිරර් කතුවැකිය, ගිය මාසයේ දී, පොලිස් කතන්දරවල ඇති තකතිරු ස්වාභාවය එලිදරව් කෙලේ ය. මෙසේ ඝාතනයට ලක් වූවන් ''අධමයින් ලෙසට හංවඩු ගැසීම'' ප්‍රතික්ෂේප කරමින් එය මෙසේ පැවසී යː

''මෙම සියලුම සිද්ධිවල දී පාහේ සැකකරු ඔවුන්ගේ ආයුධ සැඟවූ තැන් පෙන්වීම සඳහා පොලිස් නිලධාරින් රැගෙන යන විට, පොලිස් නිලධාරීන් වෙත ග්‍රෙනේඩ් හෝ තුවක්කු ප්‍රහාරයකට හදිසියේම සැකකරු සැරසෙන අතර නිලධාරීන් වහාම ක්‍රියාත්මක වී සැකකරු එතනදී ම මරා දමයි. මෙම සිද්ධීන් පරීක්ෂාවට ලක් කල අධිකරන නිලධාරින් පවා මෙම සිද්ධින්ගේ පැවති බොහෝ අහම්බයන් නොදැකීම පුදුමයට කාරනාවකි, එක් අවස්ථාවකදි මාංචු යොදා තිබුන සැකකරුවෙකු පොලිස් නිලධාරියෙකුගේ බෙල්ල මිරිකා මරා දැමීමට උත්සාහ කල විට වෙඩිතැබූ බව වාර්තා විය.''

පොලිසියේ ඉදිරිපත් කිරීම්වල ඇති ව්‍යාජභාවය තේරුම් ගැනීමට කතා දෙකක් සෑහේ. කිර්ති ප්‍රසන්න කුමාර නමැති අපරාධවලට සම්බන්ධ සැකකරුවෙකුගේ මරනය සම්බන්ධව අප්‍රෙල් 12 දින ලක්බිම පුවත්පත වර්තා කලේ ය. අප්‍රේල් 11 දින උදෑසන, කොලඹ සිට කි.මී 50ක දුරින් පිහිටි මිනුවන්ගොඩ ප්‍රදේශයේ කොටුගොඩ පිහිටි සුසාන භූමියකට පොලීසිය ඔහුව රැගෙන ගියේ ය. පොලීසියට අනුව, එහි මිනීවලක සඟවා ඇති ආයුධ ගැන කුමාර ප්‍රකාශ කර තිබින. ආයුධ සොයමින් සිටින අතර තුර, කුමාර පොලිස් සාජන්වරයකුගේ ඇඟට පැන ඔහුගේ රිවෝල්වරය උදුරා පොලීසියට වෙඩි තබද්දී පොලිස් වෙඩිපහරකින් ඔහු මරා දැමුනි. කිසිදු පොලිස් නිලධාරියකුට තුවාල සිදු වී නො තිබිනි.

ගිය මාසයේදී, සන්ඩේ අයිලන්ඩ් පුවත් පත ඒ හා සමාන පුවතක් වාර්තා කලේ යː ''මධුර ප්‍රනාන්දු යන සැකකරු මාර්තු 5වන දා අලුයම රාගමට රැගෙන එන විටදී, ඉදිරියට පැන තම මාංචුවලින් ජීප් රථයේ රියදුරු ගෙල සිර කොට මරන්නට තැත් කලේ ය. ජීප් රථය රාගම දුම්රිය හරස් පාර අසලින් පාරෙන් පිට පනින්නට යන විට පොලිස් නිලධාරින් බේරා ගන්නට සැකකරුට වෙඩි තබනු හැර වෙනත් විකල්ප මාර්ගයක් තිබුනේ නැත.''

ශ්‍රී ලංකාවේ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය ලෝසවෙඅට පැවසුවේ මේවා පොලීසියේ අධිකරන-බාහ්‍ය මිනීමැරීම් වන බවත් ශ්‍රී ලංකාවේ මිනිස් අයිතිවාසිකම් කොමිසමට මේ සම්බන්ධව මැදිහත් වන ලෙස ඉල්ලා ඇති බවත් ය. 1989-91 කාලය තුලදී දසඅතම පැතිරී තිබුනු, විරැකියාවෙන් පෙලන ගම්බද තරුනයන් සහ ජනතා විමුක්ති පෙරමුනේ සාමාජිකයින් යැයි සැක කරන ලද්දන් ඝාතනය කිරීම්වල දී පාවිච්චි කෙරුන ක්‍රමවලට සමානත්වයක් මෙහි ඇතැයි සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ නියෝජිතවරිය පැවසුවා ය. එම කාලයේ දී, දිවයිනේ දකුනු දිග පැවතුන සමාජ නොසන්සුන් භාවය මැඩලීම සඳහා 60,000 ක් පමන තරුනයන්, ආරක්ෂක හමුදා හා ඒ හා සම්බන්ධ මිනීමරු කන්ඩායම් අතින් ඝාතනය විය.

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) ව්‍යාපාරයට එරෙහි සිවිල් යුද්ධය පවත්වා ගෙන යෑම සඳහා පොලීසිය හමුදාව සමග කුලුපග විය. රටේ කුප්‍රකට හදිසි නීතිය යටතේ, දහස් ගනන් දෙමල මිනිසුන් එල්ටීටීඊ සැකකරුවන් ලෙස අල්ලා ගත් අතර කිසිදු විභාග කිරීමකින් තොරව දීර්ග ලෙස රඳවා ගැනිනි. සමහර අවස්ථාවල දී එම රැඳවියන් වධ හිංසාවලට ලක් කරන ලදී. 2002 සටන් විරාමයත් සමග ම පොලීසිය සිය අවධානය අපරාධාකරුවන් ලෙස නම් කර ඇති කොටස් වෙත යොමුකර ඇති බව පෙනේ.

ආසියානු මිනිස් අයිතිවාසිකම් කොමිසමට අනුව, 2004 වසර පලමු මාස 3 ඇතුලත දී, පොලිස් සිරභාරයේ දී සිදු වූ මරන හතක් වර්තා විය. එලටීටීඊයට එරෙහිව හමුදාව හා සම්බන්ධව සටන් වැදුන පුහුනු පොලිස් කොමන්ඩෝ සාමාජිකයන්ගෙන් සැදුම් ලත් විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් යොදා ගනිමින් පොලිස් දෙපාර්තමේන්තුව තුල ''අපරාධ මර්දන ඒකකයක්'' 2004 මැද දී ස්ථාපිත කෙරුනි.

පසුගිය නොවැම්බරයේ දී, දිස්ත්‍රික් විනිසුරු සරත් අඹේපිටිය ගිනිගහන මද්දහනේ මරා දැමීම ''නැගඑන අපරාධ රැල්ල'' ට එරෙහිව ක්‍රියාත්මක වීමට සහ එල්ලා මැරීම යලි ස්ථාපිත කිරීමේ හැකියාව සොයා බැලීමට ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් යොදා ගැනිනි. මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයෙක් විනිසුරුව මරා දමන්නට ඇති බවට චෝදනා නැගුනි. අනෙක් රටවල ''නීතිය හා සාමය'' රැකීමේ ව්‍යාපාර මෙන් ම සිත්පිත් නැති පොලිස් ඝාතන සාධාරනය කිරීමටත් අපරාධ ඇති වීමට හේතු සාධකව පවතින සමාජ ප්‍රශ්න ඇතිකිරීමේ රජයේ වගකීමෙන් අවධානය ඉවත හැරවීමටත් සාමාන්‍ය ජනතාව තුල ඇති බිය ගසා කෑමට කුමාරතුංග උත්සාහ දරයි.

සිවිල් යුද්ධයේත් විරැකියාවේත්, දසත පැතිරුන දිලිඳුකමේත් සංකලනයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රචන්ඩ අපරාධ ජනනය කෙරෙන තෝතැන්නකි. පුහුනු වූ හා ආයුධ ලබා ගැනීමේ හැකියාවෙන් යුතු දහස් ගනන් වූ හමුදා හැරගියවුන් කුලී තුවක්කුකරුවන් බවට හෝ විවිධාකාර සාපරාධී කටයුතුවල කොටස්කරුවන් බවට හැරී තිබේ. සිය විරුද්ධවාදීන්ට තර්ජනය කිරීම් වැනි මැර ක්‍රියා සඳහා දේශපාලකයින් විසින් මෙම අපරාධකරුවන් යොදා ගැනේ. අඹේපිටිය විනිසුරුගේ ඝාතකයනුත් ඇතුලත්ව සමහර අපරාධකරුවන් හට ප්‍රබල දේශපාලකයන් සහ පොලීසියමත් සමග සම්බන්ධතා ඇති බව පැවසේ.

අපරාධකරුවන් බවට සැක සහිත පුද්ගලයන් පමනක් නොව අනෙකුත් මිනීමැරීම් සම්බන්ධව ද පොලිස් නිලධාරීන්ට විරුද්ධව චෝදනා එල්ල වී තිබේ. පෝය දින මත්පැන් අලෙවිය නීතියෙන් තහනම් බැවින් මත් පැන් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කල උතුරු මැද පලාතේ පොලොන්නරුවේ අවන්හල් කලමනාකරුවෙක් වූ ක්වින්ටන් පෙරේරා 2004 ඔක්තෝබර් 3 දින පොලීසිය විසින් ඝාතනය කල බව වාර්තා විය. 2004, නොවැම්බර් 21 දා, කොලඹට තදාසන්න මාබෝලේ දී ගිනි මද්දහනේ ජෙරාඩ් මර්වින් පෙරේරා මරා දැමූ බවට පොලීසියට චෝදනා කෙරේ. පොලිස් වදහිංසාවලට එරෙහිව මීට ඉහත දී සුප්‍රීම් උසාවියේ පෙරේරා විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබ තිබිනි.

## ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම්වලට ප්‍රහාර

කුමාරතුංගගේ නවතම පොලිස් මෙහෙයුමට මාධ්‍යයේ පිටුබලය ලැබී තිබේ.''අපරාධකරුවන්ගේ අයිතීන් සහ ශිෂ්ඨ සම්පන්නයින්ගේ ඉරනම'' යනුවෙන් සිරස්තලය යෙදූ අප්‍රේල් 1 දා ද අයිලන්ඩ් පුවත්පතේ කතුවැකිය සඳහන් කලේ ''මෙම රාක්ෂයන් (අපරාධකරුවන්) කල්ලි අතර ගැටුම්වල දී මිය යා හැකිව තිබුනි. එසේ නොමැතිව සිදු විය හැකි නරකම දෙය ලෙස ඔවුන් දිගට ම ජීවත් වූවා නම්, ඔවුන් විසින් තවත් බොහෝ අය මරා දැමීමට, මංකොල්ල කෑමට හා දූෂනය කර දමන්නට ඉඩකඩ තිබිනි. අප එය පවසන්නේ කනගාටුවෙන් වුවද සත්‍යය නම් එයයි.''

පොලීසියේ අත් නිදහස් කල යුතු යැයි පවසමින් කතුවැකිය නිමා කොට තිබුනි. ''අන්තිමේදී පොලීසිය අපරාධකරුවන් සමග දුෂ්කර පන්දු ක්‍රීඩාවට මුලපුරා ඇති අතර ඔවුන්ගේ ම ක්‍රීඩාව තුල ඔවුන් මෙල්ල කොට ගෙන ඇත. සිදු කෙරෙමින් පවතින අපරාධ-විරෝධී ප්‍රහාරයන්ට කිසිදු බාධාවක් අප එල්ල කල යුතු නැත. එම කැපවුනු මිනිසුන්ට සහ නිලධාරින්ට තවත් ශක්තිය ලැබේවා!''

අප්‍රේල් 3 සන්ඩේ අයිලන්ඩ් පුවත්පතට ප්‍රකාශයක් කල ශ්‍රී ලංකාවේ පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මෙම මිනීමැරීම් සාධාරනීකරනය කලේ ය. ''අපි කිසිවෙකුත් මරා දමා නැත්තෙමු. සත්තකින්ම බරපතල අපරාධ සම්බන්ධයෙන් විවිධ කල්ලි අපි අත් අඩංගුවට ගෙන ඇත්තෙමු. කිසිවෙකු එසේ අත් අඩංගුවට ගැනීමෙන් පසුව මියගොස් ඇත්නම්, ඒ පලායාමට තැත් කිරීම නිසා හා පොලීසිය සමග ගැටුමකට යාම නිසා ය''යි ඔහු පැවසී ය.

ප්‍රජාතාන්ත්‍රික අයිතීන් පිලිබඳ සිය පිලිකුල ප්‍රනාන්දු විස්තර කෙලේ ය. ප්‍රජාතාන්ත්‍රික අයිතීන්ට පලමුව ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා 'විනය' ගත කිරීමට ප්‍රමුඛත්වය දුන් හිටපු සිංගප්පූරු අග්‍රාමාත්‍ය ලී ක්වාන් යූ ගේ කියමනක් ඔහු උපුටා දැක්වූවේ ය. ''සිවිල් සමාජය තුල විනය තිබිය යුතු අතර එය පොලීසියට පමනක් නොව සියලු දෙනාට ම පොදු විය යුතු ය. මිනිස් අයිතිවාසිකම් සංවිධාන විසින් ප්‍රමුඛත්වය දෙනු ලැබිය යුත්තේ පොලීසිය පාලනය කිරීමට නො වේ. විනීත, විනයගත සමාජයක් සහතික කරන්නට නීතිමය රාමුව තුල ක්‍රියාත්මක වන්නට පොලීසියට උදව් කිරීමට ය''යි ඔහු කීවේ ය.

මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් තවදුරටත් බාදනය කරන්නට, පොලීසිය සහයෝගීව ක්‍රියාත්මක විය. ගිය මාසයේ දී පනත් දෙකක් සම්මත කරන්නට ආන්ඩුවට විපක්ෂයේ සහාය ලැබිනි. පලමුවැන්න තුලින්

සැකකරුවෙකු වරෙන්තුවක් නොමැතිව රඳවා ගැනීම පැය 24 සිට 48 දක්වා දීර්ඝ කිරීමට පොලීසියට ඉඩ ලැබුනු අතර ඩීඑන්ඒ පරීක්ෂන සඳහා රුධිර සාම්පල ලබා ගැනීමට උසස් පොලිස් නිලධාරීන්ට බලය පැවරිනි.

යුක්තිය ඉටු කිරීම වේගවත් කිරීමේ නාමයෙන්, ඉහල අධිකරන විභාගවලට ප්‍රථම පැවැත්වීමට නියමිත අසංක්ෂේපනීය විමසුම් මගහැරීමට ඉඩ සලසාදීම දෙවන පනතේ අරුමුන යි. මෙම අසංක්ෂේපනීය විමසුම් තුලදී විත්තිකරුට විරුද්ධව නඩු නිමිත්තක් ඇති බව පොලීසිය විනිසුරුට ඔප්පුකල යුතු ය. දැන් නඩුවලට සෘජුවම විභාග කිරීම්වලට යා හැක. මෙම ක්‍රමය තුලින් විත්තිකරුට එරෙහිව පීඩනය යෙදීමට පොලීසියට ඇති හැකියාව තවත් ශක්තිමත් කර ඇත.

පොලිස් බලය ශක්තිමත් කිරීම් සහ ''නීතිය සහ සාමය'' සඳහා වූ මෙහෙයුම්, මූලිකව අපරාධකරුවන් ඉලක්ක කොට ගත්තක් නො වේ. රජයේ ආර්ථික ප්‍රතිව්‍යූහගතකරන වැඩ පිළිවෙල තුලින් ඇති වන පීඩනය මගින් ඇතිකරවන වැඩෙන සමාජමය කැලඹීම සම්බන්ධව කොලඹ පාලක කවයන්ගේ අවධානය එමගින් ප්‍රතිබිම්බනය කෙරේ. වැඩිවන මිලගනන්, විරැකියාවේ ඉහල මට්ටම් හා දරිද්‍රතාවය සහ සමාජසේවා කප්පාදු, දෙසැම්බර් 26දා ඇතිවූ සුනාමියත් සමග ඇතිවුනු විනාශයත් සමග තව දුරටත් බරපතල කෙරී ඇත.

© www.wsws.org